C
303.62
WIJ



# ජනතා විමුක්ති පෙරමුණ සහ දේශපාලන ප්‍රචණ්ඩත්වය

**1977 – 1990.**

# Janatha Vimukthi Peramuna (JVP) and Political Violence

**1977-1990.**

ඇලබඩ ගමගේ විජේසිරි

ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ

දර්ශනපති උපාධිය

සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනය.

පර්යේෂණ අධීක්ෂක

ආචාර්ය ගාමිණී සමරනායක,

දේශපාලන විද්‍යා දෙපාර්තමේන්තුව,

පේරාදෙණිය විශ්වවිද්‍යාලය,

පේරාදෙණිය.

**2001.**

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

563752

## සංක්ෂිප්තය

තුන්වන ලෝකයට අයත් ඇතැම් රටවල් 20 වැනි සියවස මැද භාගයේ සිට ජාතික දේශපාලන බලය ලබා ගැනීම සඳහා දේශපාලන ප්‍රචණ්ඩත්වය භාවිත කරනු ලැබීය. එහෙත් නිදහසින් පසුව ශ්‍රී ලංකාව සාමකාමී මැතිවරණ ක්‍රමය භාවිතා කරනු ලැබීය. එලෙස දේශපාලන බලය වෙනස් කිරීම සඳහා යොදා ගනු ලැබූ ආකෘතිය වූයේ බ්‍රිතාන්‍යය පාර්ලිමේන්තු ක්‍රමයයි. එහෙත් 1970 දශකයේ සිට ශ්‍රී ලංකාවේ ජාතික දේශපාලන බලය වෙනස් කිරීම සඳහා දකුණේ ජනතා විමුක්ති පෙරමුණත්, ජාතික දේශපානයෙන් වෙන්වීම සඳහා උතුරු නැගෙනහිර ප්‍රදේශයේත් ද්‍රවිඩ තරුණ සටන්කාමී සංවිධාන ප්‍රචණ්ඩත්වය කරා ප්‍රවිශ්ඨ වන ආකාරය දැකිය හැකිය. ඒ සඳහා පැරණි දේශපාලන පක්ෂවලින් ඉවත් වූ තරුණ කණ්ඩායම් සංවිධානය විය. මෙම ව්‍යාපාර බිහිවීමට විවිධ කරුණු ඉවහල් විය.

ඒ ලෙස බිහි වූ දේශපාලන ව්‍යාපාරයක් වශයෙන් ජනතා විමුක්ති පෙරමුණ හැඳින්විය හැකිය. 1960 දශකයේ මැද භාගයේ දී පිහිටුවනු ලැබූ ජනතා විමුක්ති පෙරමුණ ලංකාවේ දේශපාලන බලය සාධනය කර ගැනීම සඳහා ප්‍රථම වරට 1971 අප්‍රේල් කැරැල්ල මෙහෙයවනු ලැබීය. 1971 අප්‍රේල් කැරැල්ල අසාර්ථක විය. ඉන් අනතුරුව, ජනතා විමුක්ති පෙරමුණ ශ්‍රී ලංකාවේ සම්මත ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයට අනුගත වෙමින් ක්‍රියාත්මක විය. එහෙත් 1983 ජුලි මාසයේ 29 වැනි දින පක්ෂය තහනම් කිරීමෙන් පසුව තහනම ඉවත් කරවා ගැනීමට උත්සාහ කළ ජනතා විමුක්ති පෙරමුණ එය අසාර්ථක වූ පසුව දෙවන වරටත් ජාතික දේශපාලන ක්‍රමයේ බලය ලබා ගැනීම සඳහා ප්‍රචණ්ඩත්වය උපයෝගී කරගනු ලැබීය. එයට අවශ්‍ය විෂයමූලික සහ මනෝමූලික තත්වයන් ලංකාවේ එවකට පැවැති සමාජ, ආර්ථික සහ දේශපාලන ක්‍රමය වෙතින් නිර්මාණය වූ අතර, එය අර්බුදයක් දක්වා අඛණ්ඩව වර්ධනය විය. විශේෂයෙන් 1987 න් පසුව ජනතා විමුක්ති

පෙරමුණ ලංකාවේ පිළිගත් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය ප්‍රතික්ෂේප කරමින් ප්‍රචණ්ඩත්වය කරා යොමු විය. ඒ සඳහා විවිධ උපාය උපක්‍රම භාවිතා කළේය. ඒ අනුව 1977- 1990 කාල පරිච්ඡේදය ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන ප්‍රචණ්ඩත්වයෙහි දැඩි බලපෑමක් කළ අවධිය වශයෙන් සඳහන් කළ හැකිය.

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් බලපෑ සමාජ, ආර්ථික සහ දේශපාලන කරුණු මෙන්ම එමගින් ජනතා විමුක්ති පෙරමුණ වටා ඒකරාශී වූ තරුණයින්ගේ අපේක්ෂා, පරමාර්ථ ඉටුකර ගැනීම පිනිස 1977-1990 කාළ පරිච්ඡේදය තුළ අනුගමනය කළ දේශපාලන ප්‍රචණ්ඩත්වයේ බලපෑම සහ එහි ස්වභාවය පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් කිරීමටය. 1977-1990 ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් දේශීය විදේශීය බුද්ධිමතුන් විසින් අධ්‍යයනයන් විශාල සංඛ්‍යාවක් කර තිබුණ ද, එමගින් සිදුකර ඇත්තේ ජනතා විමුක්ති පෙරමුණේ ආරම්භය, වර්ධනය මතවාදය සහ සංවිධාන රටාව පිළිබඳ විවරණයක් කිරීමටය. ඇතැම් අධ්‍යයන ජන වාර්ගික ගැටළුව හා සම්බන්ධ කොට ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියා කලාපය විසතර කොට ඇත.

මෙම අධ්‍යයනය මගින් සිදු කොට ඇත්තේ 1977 1990 කාල පරිච්ඡේදය තුළ ජනතා විමුක්ති පෙරමුණේ ''ප්‍රචණ්ඩත්වය'' පිළිබඳ පුළු විෂය ක්ෂේත්‍රයක් තෝරා ගෙන එ මගින් ශ්‍රී ලාංකික දේශපාලන ක්‍රමයට කරන ලද බලපෑම සහ එහි ස්වභාවය පිළිබඳ ගැඹුරු විවරණයක් ඉදිරිපත කිරීමටය. මෙම අධ්‍යයනයේ පළමු පරිච්ඡේදය මගින් අධ්‍යයනයට අවශ්‍යය න්‍යායාත්මක පදනම සහ ප්‍රවේශය සකසා ගනු ලැබිය. එ මගින් අධ්‍යයනයේ ගැටලුව, අධ්‍යයනයේ අරමුණ සහ අධ්‍යයනයේ ක්‍රම වේදය දක්වා ඇත. දෙවන පරිච්ඡේදය මගින් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන ප්‍රචණ්ඩත්වය කෙරේ බලපෑ සමාජ, ආර්ථික සහ දේශපාලන සාධක පිළිබඳ පුළුල් විවරණයක යෙදුනෙමි. තෙවන පරිච්ඡේදය මගින් විශ්ලේෂණය කරන ලද්දේ දෙවන පරිච්ඡේදය මගින් විශ්ලේෂණය කළ

සමාජ, ආර්ථික සහ දේශපාලන සාධක හේතු කොට ගෙන අපේක්ෂා භංගත්වයට පත් වූ තරුණයින් විසින් ජනතා විමුක්ති පෙරමුණ වටා ඒකරාශීවන ආකාරයත් සහ එමගින් ගොඩනගන ලද ජනතා විමුක්ති පෙරමුණේ ආරම්භය, වර්ධනය, මතවාදය සහ සංවිධාන ව්‍යුහය පිළිබඳවය. එ මගින් දේශපාලන ප්‍රචණ්ඩත්වයට පොලඹ වන්නා වූ මතවාදයක් සහ සංවිධාන රටාවක් ගොඩනගන ලද ආකාරය විශ්ලේෂණය කොට ඇත. සිව්වන පරිච්ඡේදය මගින් 1977-1990 ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය සහ බලපෑම් පිළිබඳව ගැඹුරු විශ්ලේෂණයක් ඉදිරිපත් කොට ඇත. එ මගින් පෙන්වා දුන් ආකාරයට නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩ දේශපාලන ව්‍යාපාර අතර සමාජ, ආර්ථික සහ දේශපාලන ක්‍රමයට ඉතාම දැඩි බලපෑමක් කළ ව්‍යාපාරය ජනතා විමුක්ති පෙරමුණ වූ බව පෙනීගියේය. පස්වන පරිච්ඡේදය මගින් නිබන්ධනයේ ඉදිරිපත් වූ කරුණු සමාලෝචනය සහ නිගමනය ඉදිරිපත් කරනු ලැබීය. එ මගින් පෙන්වා දුන් ආකාරයට නිදහස් ශ්‍රී ලංකාවේ බිහිවූ ප්‍රචණ්ඩකාරී දේශපාලන සංවිධාන සහ ව්‍යාපාර අතර 1977-1990 ජනතා විමුකති පෙරමුණේ දේශපාලන ප්‍රචණ්ඩත්වය මෙතෙක් අතිවිද දරුණුතම ප්‍රචණ්ඩත්වය වන බවය. එ වැනි දේශපාලන ප්‍රචණ්ඩත්වයක් නැවත ඇතිවීම වලක්වා ගැනීම පෙරට සිවිල් සමාජය සහ දේශපාලන බලය හසුරුවීමට දායකවන සියළු දෙනාගේ වගකීම සහ යුතුකම ද වන බව පෙන්වා දෙන ලැබිය. ඒ සඳහා යෝජනා කිහිපයක ද දක්වා ඇත.

## Abstract

Since the middle of the $20^{th}$, century some countries in the third world used the political violence as a mean of gaining political power. Contrary to the fact that, Sri Lanka favoured a peaceful election behavioral pattern after the independence by accommodating to British Westminster model, but Peoples' Libation Front (JVP) formed by the members broke away from old political parties, attempted to obtain the national political power by mean of violence in 1970 and in the mean time 'separatist groups of the north and east also attempted to break away from the national politics for a separate state by using violence.

JVP, originating in mid 1960s in Sri Lanka, attempted to capture the political power by organizing two unsuccessful revolts, one was in April 1971 and the second was in 1987. After 1977 with releasing of political prisoners, JVP youth entered the liberal democratic political system, but after the prohibition of it on $29^{th}$, July 1983 as a political party, they tried continually to get the proscription lifted and found with series of failures and subsequently they attempted to use the political violence, to the second time, to capture the political power in 1987. The basic background was apparent for the both revolts. Especially after 1987 the liberal democratic political system was repeatedly rejected by JVP and confined to violence. The momentum of JVP political violence was in between 1977-1990, which lead for a crisis situation in the country. During this period JVP devised various methods for the violence.

Both local and foreign scholars have studied broadly the activities of JVP on the basis of its origin, development, ideology and structure, but this study departs from them on the ground of confinement to a smaller area called political violence of JVP and confinement to the period of 1977-1990. Further I analyse deeply the socio-economic and political factors responsible for political violence adopted by JVP, how the political violence was used to get JVP youths' expectations fulfilled, and the nature of the political violence as well.

This study contains five chapters. The first chapter lays the foundation for the thesis by constructing the theoretical background and discusses about the research problem, objectives and methodology. The second chapter analyses the causes for the violence and how they contributed for it. How frustrated youths developed the ideology and structure of the organization is the subject of the third chapter. Fourth chapter analyses deeply the nature and influence of political violence of JVP. Last Chapter concludes that the severest political violence, causing high death toll, terror and property damage, ever experienced in independent Sri Lanka is found between 1977-1990 under the leadership of JVP. Socio-economic and political factors such as, poverty, problem of unemployment, widening gap of income distribution and the conflict between younger and elder generations were the root causes for above dismal situation. Avoiding of such type of violence in future is the prime responsibility of each and every individual of Sri Lanka. Therefore, in this study, I have emphasized to resolve above causes to assure a violence free society for the future